සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

**නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන**

# “අදිති”

4

පැය 01 යි මිනි 15

විභාග අංකය .............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

''අදිති'' ප්‍රශ්න පත්‍ර පිළිතුරු හා ගැටලු සඳහා TV සත්සල් හා anueducation.lk භාවිතා කරන්න

01. පහත සඳහන් ඡේදය කියවන්න.

''අපි මෙවර ක්ෂේත්‍ර චාරිකාව සඳහා ගොවිපොළක් නැරඹීමට යමු'' යැයි ගුරුතුමා යෝජනා කළේ ය. ගොවිපොළක් යනු විවිධ බෝග වගාකරන භූමියකි. අපි ගොවිපොළක් නැරඹීමට ගියෙමු. ගොවිපොළේ විවිධ වගාවන් වගා කර තිබුණි.

''දැන්නම් හොඳට ම බඩගිනියි. අපි දවල් කෑම කමු'' යැයි කවීෂා යෝජනා කළා ය. කුඩා දොළ පාරක් අසල දී අපි දිවා ආහාරය ගත්තෙමු. ගොවිපොළ නැරඹීමේ දී කිසි ම හානියක් නොකළ යුතු බව'' ගුරුතුමා පැවසුවේ ය. ''ගොවිපොළේ අසිරිය ගැන අපි කවි කියමු'' තරිඳු පැවසුවේ ය.

ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. ක්ෂේත්‍ර චාරිකාවක් ලෙස ගියේ කොහේට ද? ..........................................................................................

ii. මෙහි සඳහන් ආකාරයට ගොවිපළක් යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

..........................................................................................................................................

iii. දිවා ආහාරය ගත් ස්ථානයේ ඇති දොළ පාරේ ප්‍රමාණාත්මක බව දක්වා ඇත්තේ කෙසේ ද?

..........................................................................................................................................

iv. ගොවිපළ නැරඹීමේ දී නොකළ යුතු යැයි ගුරුතුමා පැවසුවේ කුමක් ද?

..........................................................................................................................................

v. තරිඳු පැවසුවේ කුමක් ද? ..........................................................................................

vi. බහු වචන උක්ත පදයක් සහිත අතීත කාල වාක්‍යයක් තෝරා ලියන්න.

..........................................................................................................................................

02. සුදුසු ආඛ්‍යාත පද යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. මම ඊයේ නාට්‍ය සංදර්ශනයක් ......................................(නරඹමි./ නැරඹුවෙමු./ නැරඹුවෙමි.)
2. ගුරුතුමිය දරුවන් සමඟ චාරිකාවක් ..................................(ගියෝ ය. / ගියා ය. / ගියේ ය.)
3. කුරුලු නද දසත .................................(පැතිරෙති. / පැතිරුණි. / පැතිරුණා ය.)

03. පහත සඳහන් වාක්‍යයේ වචනවල ඇති වැරදි අක්ෂර නිවැරදි කරමින් වාක්‍ය නැවත ලියන්න.

හමුදා නිළධාරියා පැමිණ ඌගේ ගෙලෙහි මාලයක් පැළඳුවේ ය.

..........................................................................................................................................

04. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

1. ඔවුන් සියපත් ලෙස හැඳින් වූයේ නෙලුම් මල් ය
2. අම්මාත් තාත්තාත් මමත් වෙළඳපළට ගියෙමු

05. දී ඇති වචන ගළපා වාක්‍යයක් ලියන්න.

1. කිරීමට/ නුවණ/ රජතුමා/සිතී ය. / මහෞෂධගේ/ පරික්ෂා

..........................................................................................................................................

06. පහත සඳහන් වාක්‍ය ලිඛිත භාෂාවට හරවා ලියන්න.

ළමයි ක්‍රීඩා පිටියට ගිහින් ක්‍රීඩා කළා

..........................................................................................................................................

07. පහත සඳහන් අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ සහ ඉඟි වැකිය තිත් ඉරි මත ලියන්න.

1. අදූරු දර්ශි උපදෙස් දීම - ..........................................................................................
2. වගකීමෙන් මගහැර යෑම - ..........................................................................................

08. පහත සඳහන් වචනවල ඉරි ඇඳි අක්ෂරයට යෙදී ඇති පිල්ලම හඳුන්වන පිල්ලම් නාමය ලියන්න.

1. එළවළු - ..............................................................
2. ප්‍රධාන - ..............................................................

09. පහත වාක්‍යයේ හිස්තැනට සුදුසු යුගල පද වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

1. සයුරි ..........................................(අහල පහල/ යාන වාහන) අය සමග සෙල්ලම් කරයි.
2. සීයා උපැස් යුවළ ...............................( එහෙ මෙහෙ/අස්සක් මුල්ලක්) නැර සෙව්වේ ය.

10. පහත සඳහන් වචනවල මූලය යෙදන ශබ්දය නම් කරන්න.

වෛද්‍යාචාර්ය - ............................................... රූනා - ...............................................


11. ''මම හෙට එන්නම්'' යන වාක්‍ය ඉංග්‍රීසි භාෂාවෙන් නිවැරදිව ලියා ඇති වාක්‍ය තෝරන්න.

1. I come will tomorrow 2. I will come tomorrow 3. tomorrow I will come

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න



| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |





| | | | | |
|---|---|---|---|---|
| | | | | |

13. පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍ය ගලපා අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.

1. a / have / you / Do / pet? ..............................................................
2. He / Anuradhapura / in / lives ..............................................................

14. 'නන්බි' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

..........................................................................................................................

15. පහත වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

1. අතනට යන්න ..............................................................
2. අයියා ඉන්නවා ..............................................................

16. ''නීරෝගී දිවි පැවැත්මක් සඳහා අපට කළ හැකි දේ'' යන මාතෘකාව යටතේ අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න. සෑම වාක්‍යයක ම වචන පහක්වත් තිබිය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

1 ..........................................................................................................

..........................................................................................................

2 ..........................................................................................................

..........................................................................................................

3 ..........................................................................................................

..........................................................................................................


- පිළිතුරු සපයන්න.

17. දී ඇති සංඛ්‍යාවේ ඉරි ඇඳි ඉලක්කමේ ස්ථානීය අගය හා නිරූපිත අගය වෙන වෙන ම ලියන්න.

**4<u>2</u>256** ස්ථානීය අගය ..................................

නිරූපිත අගය ..................................

18. මෙම ගණක රාමුවේ කුරු සියල්ල ම භාවිතා කරමින් ගණක 10ක් යොදාගෙන නිරූපණය කළ හැකි අව ම අගය ඇඳ පෙන්වන්න.



19. 'විසිහය දහස් නවසිය හැට පහ' යන්න ඉලක්මෙන් ලියන්න.

.............................................................................................................................

20. සංඛ්‍යා යෙදී ඇති රටාව අනුව ඊළඟ හිස්තැන් දෙකට ආ යුතු පිළිතුර හිස්තැනෙහි ලියන්න.

2 5 4 10 6 15 ............ ............


21. ඇඟලුම් කම්හලක ජනවාරි මාසයේ මැසූ කමිස සංඛ්‍යාව 6254කි. පෙබරවාරි මාසයේ, ජනවාරි මාසයට වඩා කමිස 628ක් මැසුවේ නම් මාස දෙකේ ම මැසූ කමිස සංඛ්‍යාව කොපමණ ද?

.............................................................................................................................

22. ගමනක මුළු දුර $28km$ $250m$ කි. නදුල එම දුරෙන් $13km$ $500m$ක දුරක් ගමන් කර ඇත. නදුලට ගමන් කිරීමට ඉතිරි ව ඇති දුර කොපමණ ද? ...........................................................

23. වෙරළු ගෙඩි 7 බැගින් මලු 6ක් ද, වෙරළු ගෙඩි 8 බැගින් මලු 6ක් ද, ඇත. මලු දොළහෙ ම තිබෙන වෙරළු ගෙඩි ගණන කීය ද?.........................................................................


24.




පහත දැක්වෙන භාජනයේ උස $80cm$කි. මෙහි $20cm$ක් උසට ජලය පිරී ඇත. මුළු භාජනයට අල්ලන ජල පරිමාව $280l$ නම් දැනට පිරී ඇති ජල පරිමාව සොයන්න.

.........................................................

25.




i. රූපයේ අඳුරු කර ඇති කොටස දහයෙන් පංගුවක් ලෙස කීය ද?...................................................

ii. අඳුරු නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

...................................................

26. පුටු 927ක් පාසල් 9ක් අතර සමාන ව බෙදා දුන්විට එක පාසලකට ලැබෙන පුටු ගණන කීය ද?...................................................

27. බිත්තර 72කින් $\frac{3}{4}$ක් අලෙවි කළේ නම්, ඉතුරු බිත්තර ගණන කීය ද?.............................................

28. 


A භාජනයේ ඇති සීනි ප්‍රමාණය හිස් කිරීමට සීරුවට B භාජනයෙන් කී වතාවක් ඉවත් කළ යුතු ද?

.............................................................


29. අනුරාධපුර ප්‍රධාන දුම්රිය ස්ථානයට පෙ.ව.9.40ට ළඟා වීමට නියමිත ව තිබූ දුම්රියක් කාර්මික දෝෂයක් හේතුවෙන් මිනිත්තු 45ක් ප්‍රමාද වී පැමිණෙන බව ශබ්ද විකාශන යන්ත්‍රයෙන් ප්‍රකාශ විය. දුම්රිය, වේදිකාවට ළඟා වෙන වේලාව පැය 24 වේලාවෙන් ලියන්න.

.............................................

30. පහත දැක්වෙන බිල්පත සම්පූර්ණ කරන්න.

| **ද්‍රව්‍යය** | **ප්‍රමාණය** | **1kg ක මිල** | | **වටිනාකම** | |
|---|---|---|---|---|---|
| | | රු | සත | රු | සත |
| පරිප්පු | 500g | ........... | ...... | 296 | 00 |
| සීනි | 250g | 180 | 00 | ........... | ...... |

31. පහත දැක්වෙන්නේ සත්ත්ව ගොවිපොළක සිටින සතුන්ගේ පාද සංඛ්‍යාව නිරූපණයවන ප්‍රස්තාරයකි.




i. ගොවිපොළේ සිටින ගවයන් ගණන කීය ද? .........................................................

ii. ගොවිපොළේ සිටින මුළු සතුන්ගේ පාද ගණන කීය ද?.........................................................

- 32.සිට 62 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

32. පාත්තිවල බීජ සිටුවා පැළ ලබා ගන්නා බෝගයක් වන්නේ,

i. වම්බටු　　　ii. තක්කාලි　　　iii. බෝංචි

33. පාදයකට සර්පයෙක් දෂ්ඨ කළ විට සිදුවිය හැකි භයානක ම සිදුවීම කුමක් ද?

i. සිහි මූර්ඡා වීම.

ii. කතා කිරීමට නොහැකි වීම.

iii. මිය යාම.

34. මේ අතරින් ජලය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.


  i. රත්වීමේ දී වාෂ්ප වේ.
  ii. අධික සීතලයට ලක්කළ විට ඝන වේ.
  iii. තෙල් වර්ග, මුහුදු ජලය සමඟ මිශ්‍ර වේ.

35. ශ්‍රී ලංකාව තුළ තව ම සිදු නොවුණු ස්වාභාවික විපත කුමක් ද?

  i. නාය යාම  ii. සුනාමි  iii. ගිනිකඳු පිපිරීම්

36. පහත ආහාරවලින් ශරීරයේ පිරිපුන් බව හීන වී යාමට බලපාන ආහාර වර්ගය වනුයේ.

i. 


ii. 

iii. 


37. කෑමක් රසවත් හා වර්ණවත් කිරීමටත් විෂබීජ නාශකයක් ලෙසත් යොදා ගන්නා ශාක වර්ගයක් වන්නේ,

  i. ඉගුරු  ii. කහ  iii. මිරිස්

38. පහත පින්තූර අතරින් වඩු කර්මාන්තය සඳහා භාවිත කරන උපකරණය වන්නේ,

i. 
ii. 
iii. 

39. බට්ටා පැනීමේ ක්‍රීඩාවේ දී ඉවත් වීමට සිදුවන්නේ,

  i. බට්ටා නිවැරදිව කොටුව තුළට දැමීම.
  ii. බට්ටා සිටින කොටුවට පැනීම.
  iii. බට්ටා සිටින කොටුව මග හැර නිවැරදි ව කොටුවෙන් කොටුව පැනීම.

40. විශාලත්වයෙන් කුඩා පක්ෂියෙකු වන්නේ,

  i. ගේ කුරුල්ලා  ii. බට්ටිත්තා  iii. ගිරවා

41. දේශීය අමුද්‍රව්‍ය පමණක් යොදා ගනිමින් නිෂ්පාදනය සිදු කරන භාණ්ඩ සඳහා ලබා දිය හැකි ප්‍රමිති සහතිකය වනුයේ,

  i. ISO ලාංඡනය  ii. SLS ලාංඡනය  iii. සූර්ය සිංහල ලාංඡනය

42. මෑත කාලයේ දී ලංකාවට මුහුණ දීමට සිදු වූ ස්වභාවික විපත නම් කර තිබුණේ

  i. දිට්වා සුළි කුණාටුව  ii. දිට්ටා සුළි කුණාටුව  iii. දිත්වා සුළි කුණාටුව


43. අපි හැමෝට ම පානය කළ හැකි ගුණදායක ස්වභාවික පානයකි.

  i. කොළ කැඳ  ii. දොඩම්  iii. පොල්වතුර

44. අප එළවළු වර්ග ආහාරයට එක්කර ගැනීමේ දී සැලකිය යුතු කරුණක් වන්නේ,

  i. වර්ණ කිහිපයකින් යුතු එළවළු වර්ග විය යුතු ය.
  ii. එක ම වර්ණයකින් යුත් එළවළු වර්ග විය යුතු ය.
  iii. වර්ණ පිළිබඳ සැලකිල්ලක් නොදැක්විය යුතු ය.

45. පහත රූපයේ දැක්වෙන පරිදි ධ්‍රැව වර්ණ කරන ලද දණ්ඩ චුම්බකයක් මැදින් නූලකින් එල්ලා තිබෙන ඇටවුමකි. දණ්ඩ චුම්බකය යම් දිශාවකට හැරී නිශ්චල වූ විට නිල් පැහැති කෙළවර යොමුව ඇති දිශාව වන්නේ,




i. දකුණු දිශාව ය.
ii. උතුරු දිශාව ය.
iii. නැගෙනහිර දිශාව ය.

46. සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රධාන අංග තුනකි. එය නිවැරදි ව පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. යවන්නා → මාධ්‍යය → ලබන්නා
ii. මාධ්‍යය → යවන්නා → ලබන්නා
iii. ලබන්නා → මාධ්‍යය → යවන්නා

47. ජීවිතයට ආභරණයක් ලෙස අප ළඟා කරගත යුත්තේ

i. සංකීර්ණ බව ය. ii. සරල බවය ය. iii. ආභරණ ය.

48. ක්ෂීරපායි සතෙකු නොවන්නේ,

i. ඉබ්බා ii. වවුලා iii. ඩොල්ෆින්

49. පුද්ගලයෙක් දිනකට පානය කළ යුතු නියමිත ජල ප්‍රමාණය පානය නොකිරීමෙන් ශරීරයේ වඩාත් ආපදාවට ලක්විය හැකි ඉන්ද්‍රිය වන්නේ,

i. පෙනහලු ය. ii. වකුගඩු ය. iii. අක්මාව ය.

50. හේන් ගොවිතැනෙහි බහුල ව වගාකරන බෝගයක් වන්නේ,

i. කංකුං ii. තල iii. වී

51. පොසොන් උත්සවය නිමිත්තෙන් පාසලක සංවිධානය කර තිබූ පෙරහැරක් ආරම්භ කිරීමට පෙර විදුහල්පතිතුමා පෙරහැර ගමන් කළයුතු මාර්ග සටහන සිසුන් ව දැනුවත් කළේ ය. ඒ අතර පෙරහැර ගමන් කරන විට මාර්ගයේ වම් පසින් ගමන් කළයුතු බව එතුමා දන්වා සිටියේ ය. විදුහල්පතිතුමාගේ මෙම ප්‍රකාශය.

i. නිවැරදි ය.
ii. වැරදි ය.
iii. නිශ්චිතව ම හරි වැරදි ලෙස කිව නොහැකි ය.

52. පැණි රස කෑම වැඩිපුර ගැනීම අව ම කළ යුත්තේ,

i. අධික රුධිර පීඩයෙන් පෙළෙන රෝගීන් ය.
ii. දියවැඩියාව රෝගයෙන් පෙළෙන රෝගීන් ය.
iii. අම්ලපිත්ත රෝගයෙන් පෙළෙන රෝගීන් ය.

53. මාංශ බෝග ගණයට අයත් ආහාරයක් වන්නේ,

i. මස් ii. පරිප්පු iii. බිම්මල්

54. ''ඉර දෙවියන්ගේ ඉරගල ගාවා'' යන කවිය අයත් වන්නේ,

i. පැල් කවි ii. ගොයම් කවි iii. පතල් කවි

55. මෙම ගිලන් රථය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

i. 1990 දුරකථන අංකය ඇමතීමෙන් මෙහි සේවාව නිවසට ම ලබා ගත හැකි ය.

ii. මෙම සේවය ලබා ගැනීමට මුදල් ගෙවිය යුතු ය.

iii. මෙම සේවය දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වේ.




56. යමෙකුට අප උදවු කළ යුත්තේ,

i. ඔහු අසරණ යැයි සිතා ය.

ii. ඔහුගෙන් යම් උපකාරයක් බලාපොරොත්තුවෙන් ය.


iv. ඔහු ද තමා වගේ ම කෙනෙක් සේ සලකා ය.

57. මෙහි දැක්වෙන්නේ කප්පියක් ආධාරයෙන් සිදුකරන ක්‍රියාවකි. ඒ සම්බන්ධයෙන් ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. මෙයින් යමක් ඉහළට එසවීම පහසු කරයි.

ii. මෙයින් යමක් පහළට යැවීම පහසු කරයි.

iii. යමක් ඉහළට එසවීමත් පහළට ගැනීමටත් පහසු කරයි.




58. පොදු ප්‍රවාහන සේවයේ ලක්ෂණයක් වන්නේ,

i. වැඩි වියදම් සහිත බව.

ii. අනාරක්ෂිත බව.

iii. රජයේ ආයතන මගින් පාලනය වීම.

59. අපේ උරුමයන් නැති වී යාමට හේතුවක් නොවේ.

i. වටිනාකම හඳුනා නොගැනීම.

ii. නිධන් වස්තු හොරකම් කිරීම.

iii. පුරාවස්තු ආරක්ෂා කිරීම.

60. ඉතා ඉක්මනින් කල් ඉකුත් විය හැකි ආහාරයකි.

i. යෝගට්     ii. මුදවපු කිරි     iii. පිටි කිරි

61. ''මම රටට වැඩදායි ගුණගරුක දරුවෙක් වෙනවාම යි'' මෙය සුවපත්විමේ ක්‍රියාකරකම්වල,

i. අධිෂ්ඨානයයි     ii. ප්‍රාර්ථනාවයි     iii. උදානයයි

62. දිවා කාලයේ හැසිරෙන පක්ෂියෙකු නොවන්නේ,

i. උකුස්සා     ii. උලමා     iii. ඇටිකුකුළා